# උතුරු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පවතින තාක්ෂණික නිලධාරි (සිවිල්) සේවක සංඛ්‍යාව යටතේ කොන්ත්‍රාත් පදනම මත තාක්ෂණික නිලධාරි අභ්‍යාසලාභී පත්වීම් ලබා දීම සඳහා අයදුම්පත් කැඳවීම - 2018

1. උතුරු පළාත් රාජ්‍ය සේවයේ තාක්ෂණික නිලධාරි (සිවිල්) සේවක සංඛ්‍යාව යටතේ පුරප්පාඩු පවතින තනතුරු වලට කොන්ත්‍රාත් පදනම මත තාක්ෂණික නිලධාරි අභ්‍යාසලාභී පත්වීම් ලබා දීම පිණිස සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

   අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය 2018.03.22

2. සේවා කොන්දේසි
   2.1 මෙම කොන්ත්‍රාත් පදනම මත පත්වීම් සේවා කාලය මාස 5ක් නොඉක්මවිය යුතුය. අදාළ කාලය අවසානයේදී ගිවිසුම අහෝසි වේ.
   2.2 කෙසේ වුවද සේවා අවශ්‍යතාව හේතු කොට ගෙන හා අභ්‍යාසලාභියාගේ සතුටුදායක සේවය සැළකිල්ලට ගෙන නැවත නැවතත් මාස 5ක කාල සීමාවන් වලට යටත් කොට නව ගිවිසුම්වලට එළඹිය හැක.
   2.3 අභ්‍යාසලාභීන්ගේ පැමිණීම, හැසැරීම ආදිය අසතුටුදායක වන්නේ නම් කෙටි කාලයක් තුළ සිදු කෙරෙන දැනුම් දීමකින් අනතුරුව අදාළ සේවය අවසන් කළ හැක.
   2.4 මෙම පත්වීම් තාවකාලික වන අතර පත්වීම් ලාභීන් වෙනත් කිසිදු පත්වීමක් යටතේ ස්ථිර පත්වීමක් ඉල්ලුම් කිරීමට හිමිකමක් නොමැත.
   2.5 පත්වීම ලබන්නා උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානමින් සිටිය යුතුය.(විශේෂයෙන් යාපනය දිස්ත්‍රික්කය හැර අනෙකුත් දිස්ත්‍රික් වල සේවා අවශ්‍යතාව ඇත)

3. සාමාන්‍ය සුදුසුකම්
   3.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
   3.2 අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය.
   3.3 අයදුම්කරු මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා හොඳ හැසිරීමකින් යුක්ත විය යුතුය.
   3.4 අයදුම්කරු/ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර හෝ උතුරු පළාතේ ස්ථිර පදිංචිය සහිත වූවන් විය යුතුය.

4. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්
   4.1 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

   අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් එක් වරකදී භාෂාව (දෙමළ/ සිංහල/ ඉංග්‍රීසි) ගණිතය, විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් 4ට සම්මාන සාමාර්ථ ඇතුළුව විෂයයන් 6කින් සමත් විය යුතුය.

   තවද,

අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් ශුද්ධ ගණිතය/ ව්‍යවහාරික ගණිතය/ සංයුක්ත ගණිතය සමග භෞතික විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් තුනකින් එක් වරකදීම සමත් විය යුතුය.

4.2 පහත සඳහන් අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන හදාරා අදාළ අධ්‍යයන සහතිකය ලබා ගත් අයෙක් වනු අතර අවසන් විභාගට පෙනී සිට විභාග ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින පහත දැක්වූ අධ්‍යාපන ආයතනයේ සති අන්ත දිනයන්හි පමණක් ආධුනිකයෙකු ලෙස සිටින අය මෙම තනතුරට වෘත්තීය සුදුසුකම්ලත් අය ලෙස පිළිගනු ලැබේ.

(1) මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි තාක්ෂණික ආයතනය මගින් නිකුත් කරන ලද ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සිවිල් සහතිකය
හෝ
(2) ජාතික ආධුනික හා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන ලද ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා සිවිල් සහතිකය හෝ
(3) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ මගින් නිකුත් කරන ලද ඉංජිනේරු ඩිප්ලෝමා සිවිල් සහතිකය හෝ
(4) අනුමත ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයක් මගින් නිකුත් කරන ලද තාක්ෂණික ඩිප්ලෝමා සිවිල් සහතිකය හෝ
(5) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළමු වන කොටස සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබීම හෝ
(6) තාක්ෂණික නිලධාරි (සිවිල්) අංශයේ ජාතික තාක්ෂණික සුදුසුකම් (NVQ) 6වන මට්ටම සම්පූර්ණ කර තිබිය යුතුය. හෝ
(7) තෘතියීක වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික විද්‍යාලයකින් ලබා ගන්නා ලද ජාතික තාක්ෂණික (සිවිල්) සහතික (NCT - Civil) හෝ
(8) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා ඉහත කී අදාළ තාක්ෂණික සහතිකය නිකුත් කරන ලද ආයතනයේ අදහස් ලබා ගැනීමෙන් පසුව ඉහත තාක්ෂණික සුදුසුකම් සියල්ල සමාන බවට තෘතියික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් වෙනත් සුදුසුකම්

4.3 අයදුම්කරු අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

4.4 අයදුම්කරු මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා හොඳ හැසිරීමකින් යුක්ත විය යුතුය.

4.5 අයදුම්කරු/ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර හෝ උතුරු පළාතේ ස්ථිර පදිංචි අය විය යුතුය.

5. බඳවා ගැනීමේ ක්‍රමය

5.1 අයදුම්කරුවන්ගේ අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉල්ලුම් කරන ලද සුදුසුකම්ලත් අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
5.2 සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුගේ තනතුරට අදාළ සුදුසුකම් සහිත ලිපි ලේඛන පරීක්ෂා කර අයදුම්කරුගේ තාක්ෂණික දැනුම ද පරීක්ෂා කරනු ලැබේ.
5.3 අයදුම්කරු තනතුර සඳහා වන සුදුසුකම් සපුරා ඇති බවට හා අපේක්ෂා කරන ලද තාක්ෂණික දැනුම සහිත බව පෙනී ගිය හොත් පහත සඳහන් පරිදි ප්‍රමුඛත්ව පදනම මත පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
- 4.2 ඡේදයේ පහත සඳහන් වෘත්තීය අධ්‍යාපන ආයතන වලින් අධ්‍යාපනය හදාරා අදාළ සහතික ලබා ගත් අය
- 4.2 ඡේදයේ පහත සඳහන් වෘත්තීය අධ්‍යාපන ආයතන වලින් අධ්‍යාපනය හදාරා අවසන් විභාගයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අය
- 4.2 ඡේදයේ පහත සඳහන් වෘත්තීය අධ්‍යාපන ආයතන වලින් සති අන්ත දිනයන්හි අධ්‍යාපනය හදාරාන අය

5.4 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට හැකි විය යුතුය.

6. අයදුම් කරන ක්‍රමය
මේ සම්බන්ධව අවශ්‍ය තොරතුර සහ ආදර්ශ අයදුම්පත් උතුරු පළාත් සභාවේ www.np.gov.lk යන වෙබ් අඩවියෙහි Recruitment & Exam අංශයේ ඇතුලත Advertisement 2018 වෙත සම්බන්ධ වී බාගත කර හැක.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018.03.22 දිනට හෝ එදිනට පෙර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - පරිපාලන, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් කාර්යාලය, උතුරු පළාත, පළාත් සභා සංකීර්ණය, **A**9 පාර, කයිතඩි, යාපනය යන ලිපිනයට ලිපි කවරයේ වම් කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පවතින තාක්ෂණික නිලධාරි(සිවිල්) සේවක සංඛ්‍යාව යටතේ කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් අභ්‍යාසලාභී පත්වීම් ලබා දීම පිණිස අයදුම් කිරීම"** ලෙස සඳහන් කර ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කරන ලෙස දන්වමි.

7. වැටුප් පරිමාණය
සියළු වැටුප් තලයන් ඇතුලත්ව ඒකාබද්ධ මාසික දීමනාව ලෙස රුපියල් 30000ක් ගෙවනු ලැබේ. මෙම පත්වීම සේවක අර්ථසාධක අරමුදලට (EPF) හා සේවක භාර කාර අරමුදලට (ETF) දායක වේ. රාජකාරි දින වල ලබා ගන්නා නිවාඩු වෙනුවෙන් දිනකට රුපියල් 1000ක මුදලක් අය කරනු ලබන අතර රජයේ නිවාඩු හා වාර අවසාන දින වල රාජකාරි වල යෙදෙන ලෙස නියෝග කරනු ලබන අවස්ථාවල ඊට අදාළව හිලව් නිවාඩු අනුමත කරනු ලැබේ.

ඒ. පත්තිනාදන්,
ප්‍රධාන ලේකම් 2018.02.22
උතුරු පළාත.